**ICPBS-23-BP-21**

# ආදි බුදුදහමේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය හා ආලය විඥානය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්.

කරපික්කඩ සෝභිත හිමි
මැදවච්චියේ සංඝානන්ද හිමි
msangananda123@gmail.com

**සාරසංක්ෂේපය**

බුදුදහමෙහි මූලික අරමුණ නිර්වාණාවබෝධය මගින් සංසාරගත නිවෘත්තිය සලසාලීමයි. නිර්වාණාවබෝධයෙහිලා ශ්‍රාවකයා තුළ අභිප්‍රේරණයක් ඇති වීම පිණිස සත්ත්වයාගේ ස්වභාවය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ ඇති තතු හැඳිනගැනීම අත්‍යවශ්‍ය සාධකයකි. මේ අනුව ඥානය ලබාගැනීමේ ක්‍රමවේදයක් ලෙස ප්‍රත්‍යක්ෂය පෙන්වා දෙයි. ප්‍රත්‍යක්ෂය ඉන්ද්‍රිය හා අතීන්ද්‍රිය යනුවෙන් දෙයාකාර වන බව බෞද්ධ විග්‍රහය වේ. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය යනු සත්ත්වයාගේ අවබෝධය ගොඩනැගීම සඳහා ඉන්ද්‍රිය පද්ධතියෙන් ලැබෙන මහෝපකාරයයි. මේ අනුව ඉන්ද්‍රියන්ට ගෝචර වන අරමුණු තුළින් එයට අනුකූලවන විඥානයක් පහළ වන ආකාරය දැක්වීම ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය ලෙස අවධාරණය කරනු ලබයි. නිරෝගි අභ්‍යන්තර ඉන්ද්‍රියකුත්, සුදුසු විෂය අරමුණකුත් මුණගැසුණු විට එම ඉන්ද්‍රියානුසාරී විඥානය පහළ වෙයි. ඉන් අනතුරුව ප්‍රතීත්‍යසමුත්පන්න වෛඥානික ක්‍රියාවලියක් ඔස්සේ ආයතනය, ආරම්මණය හා විඥානය එකතු වී ස්පර්ශයත්, ස්පර්ශය ප්‍රත්‍ය කරගෙන වේදනාවත්, වේදනාව ප්‍රත්‍ය කරගෙන සංජානනයත්, සංජානනය ප්‍රත්‍ය කරගෙන විතර්කයත්, විතර්කය ප්‍රත්‍ය කරගෙන ප්‍රපංචය ගොඩ නගයි. එනම් සාමාන්‍ය සිතුවිලිවලින් එහා ගිය තණ්හා, දිට්ඨි, මාන යන කෙළස්

ගොඩනැගෙන පරිදි චින්තනය මෙහෙයවයි. පුද්ගලයා ඉන්ද්‍රිය මගින් ලබන්නා වූ ප්‍රත්‍යක්ෂය යථාර්ථවාදයට ප්‍රමාණවත් නොවන බවත්, පුද්ගලයා දුකට පත්වීමට උපස්ථම්භයක් වන බවත් බුදුසමය වැඩිදුරටත් විස්තාරණය කරනු ලබයි. චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායන් අතර ප්‍රමුඛතම සම්ප්‍රදායක් ලෙස යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය හැඳින්විය හැකි ය. එහි මූලිකම ඉගැන්වීමක් ලෙස විඥාන පරිණාමයේ ඇති ආලය විඥානය පෙන්වා දිය හැකි ය. බාහිර ලෝකය සත්‍ය වශයෙන් පවත්නා යථාර්ථයක් ලෙස නො සලකන විඥානවාදීහු එය ආලය විඥානයේ ප්‍රක්ෂේපනයක් ලෙස සලකති. කැඩපතකින් තමාගේම මුහුණ දෙස බලන්නාක් මෙනි. **කර්මබීජ, ක්ලේෂබීජ හා ස්මෘතිබීජ** ආලය විඥානය තුළ තැන්පත්ව පවතින නිසා මෙය කෝෂ්ඨාගාරයක් වශයෙන් විඥානවාදීන් හඳුන්වනු ලබයි. යම් ආකාරයකින් ඕඝය තණ, දරකැබලි, ගොම ආදිය ගෙන යමින් පවතියි ද, ඒ ආකාරයෙන් ආලය විඥානය කුශල, අකුශල හා ආනේඤ්ජ කර්ම වාසනාවලින් අනුගත වෙමින් ස්පර්ශ මනසිකාරාදිය ගෙන යමින් සැඩ පහරක් මෙන් සංසාරයේ පැවැත්මේ කෙළවර තෙක් පවතිමින් ගමන් කරයි. ආලය විඥානය සමග හුදෙක් සියලු තැන ගමන් කරන චෛතසික පහක් දැකිය හැකිය. එම චෛතසික වනුයේ **ස්පර්ශ, මනස්කාර, වේදනා, සංඥා හා චේතනාවයි.** ඉන්ද්‍රිය, විෂයය හා ආලම්බන යන ත්‍රිකය එක්වීමෙන් ස්පර්ශය හට ගනු ලැබේ. ඉන් අනතුරුව පිළිවෙලින් මනස්කාර, වේදනා, සංඥා හා චේතනා පුද්ගල සන්තානය තුළ පටිච්චසමුප්පන්නව උපදවනු ලබයි. ආලය විඥානය නිරුද්ධ වනුයේ අර්හත්වයේ දී ය. එබැවින් මෙයට **'විමල විඥානය'** යැයි කියනු ලැබේ. **'ආලය'** යන්නෙන් **'ඇලුණ'** යන අර්ථය යෝගාචාර විඥානවාදයේ මෙන් ම ආදි බුදුදහමේ ද පෙන්වා දෙයි. අපගේ මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ආදි බුදුදහමේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය හා යෝගාචාර විඥානවාදයේ ආලය විඥානය තුළ සමානතාවයක් දැක ගත හැකි වේ ද? බහුලව ඇත්තේ සමතාවයන් ද? එසේත් නොමැතිනම් විෂමතාවයන් ද? යන්න පිළිබඳව වෙන් වෙන්ව අධ්‍යයනය කිරීමට මෙන් ම ඒ සඳහා මජ්ඣිම නිකායේ

මධුපිණ්ඩික සූත්‍රයත්, යෝගාචාර විඥානවාදීන්ගේ විඥප්තිමාත්‍රතාසිද්ධිවාදයත් මූලාශ්‍ර කර ගැනීමට අපේක්ෂා කරමි.

**ප්‍රමුඛ පද:** විඥානය, ප්‍රත්‍යක්ෂය, ධර්ම, සත්ත්වයා, කර්මය